ඇමුණුම් අංක 01

**සමෘද්ධි සහනාධාරලාභී පවුලක් තෝරා ගැනීමේ නිර්නායක හා පරීක්ෂණ වාර්තාව (සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරාගැනීමේ පෝරමය)**

දිස්ත්‍රික්කය - ................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - .............................

සමෘද්ධි බැංකු කලාපය - .................................................... ග්‍රාම නිලධාරි වසම - .........................................

ඉල්ලුම්කරුගේ නම - ................................................................................................................................

හැඳුනුම්පත් අංකය - ........................................................ දුරකථන අංකය - ..........................................

ලිපිනය - ....................................................................................................................................................

| පවුලේ සාමාජිකයන් ගේ නම් (මුලකුරු සමඟ) | වයස | රැකියාව/ නියුක්තිය | ආදායම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| | 01. **අධ්‍යාපනය** |
| 1.1 | පවුලේ කිසිම සාමාජිකයෙකු 8 ශ්‍රේණිය සමත්ව නොමැති වීම |
| 1.2 | ආර්ථික අපහසුතා හේතුවෙන් පාසල් යන වයසේ සිටින නමුත් පාසල් නොයන ළමයින් සිටීම. |
| | 02. **සෞඛ්‍යය** |
| 2.1 | පවුලේ සාමාජිකයෙකු දීර්ඝ කාලීන රෝගයකින් පෙළීම. |
| 2.2 | පවුලේ සාමාජිකයෙකු ආබාධිත තත්ත්වයේ සිටීම. |
| | **03. ආර්ථික තත්ත්වය** |
| 3.1 | ඒක පුද්ගල ආදායම් රු.6000/- ට අඩු වීම. |
| 3.2 | ඒක පුද්ගල වියදම රු.5,500/- ට අඩු වීම. |
| 3.3 | විදුලිය / ජල / දුරකථන බිල්පත් වල මාසික වටිනාකම රු. 2000/- ට අඩු වීම. |
| | **04. වත්කම්** |
| 4.1 | තමාටම අයත් අක්කර 0.5 අඩු ඉඩමක් තිබීම. ඉඩම විශාල වුවද ස්වාභාවික විපත් මත සාර්ථකව වගා කළ නොහැකි වීම |
| 4.2 | අනෙකුත් වත්කම් යටතේ පාපැදි, යතුරු පැදි (125CC ධාරිතාවට අඩු) ස්කූටර් හැර වෙනත් වංචල වත්කම් නොතිබීම. |
| 4.3 | ගෘහ උපකරණ යටතේ ගුවන් විදුලි, රූපවාහිනී, විදුලි පංකා, සාමාන්‍ය ජංගම දුරකථන හැර වෙනත් උපකරණ නොතිබීම. |
| 4.4 | යාන්ත්‍රික ධීවර යාත්‍රා හා යාන්ත්‍රික කෘෂි උපකරණ නොතිබීම. |

| | |
|---|---|
| | **05. නිවස** |
| 5.1 | ඉල්ලුම්කාර පවුලට පදිංචිය සඳහා පවුලටම අයිති නිවසක් නොතිබීම හා පහත නිර්ණායක පහසුකම් නොමැතිවීම. |
| 5.1.1 | පරිභෝජනය සඳහා පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වීම. |
| 5.1.2 | නිසි වැසිකිලි පහසුම් නොතිබීම. |
| 5.1.3 | ආලෝකය ලබා ගැනීම සඳහා භූමිතෙල් වැනි ක්‍රම භාවිතය |
| 5.2 | ඉල්ලුම්කාර පවුලට පදිංචිය සඳහා ඔවුනටම අයිති නිවසක් තිබේ නම්<br>පහත නිර්ණායක අනුව ලකුණු හිමිවේ. |
| 5.2.1 | ඉල්ලුම්කරු පැල්පත්, මුඩුක්කු, පේලි / ලයින් කාමර වල පදිංචිව සිටීම. |
| 5.2.2 | පදිංචි නිවසේ බිත්ති, මැටිගල්, මැටි, ලෑලි, ටකරන්, පොල්අතු, තල් අතු ආදිය |
| 5.2.3 | වහල - ටකරන්, පොල් අතු, පිදුරු ආදියෙන් ද සමන්විතව තිබීම |
| 5.2.4 | සියළු කටයුතු හා නිදා ගැනීමට වෙන් වූ එක් කාමරයක් පමණක් තිබීම. |
| 5.2.5 | ගෙබිම වර්ගඵලය වර්ග අඩි 650 ට අඩු වීම. |
| 5.2.6 | පරිභෝජනය සඳහා පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වීම. |
| 5.2.7 | නිසි වැසිකිලි පහසුම් නොතිබීම. |
| 5.2.8 | ආලෝකය ලබා ගැනීම සඳහා භූමිතෙල් වැනි ක්‍රම භාවිතය |
| | **06. සලකා බැලිය යුතු වෙනත් කරුණු** |
| 6.1 | පවුලේ සාමාජික සංඛ්‍යාව -<br>(1-2 ලකුණු 05/ 3-4 ලකුණු 07/ 5 සහ වැඩි ලකුණු 10) |
| 6.2 | කමිටුව හඳුනාගත් විශේෂ නිර්නායක -01 |
| 6.3 | කමිටුව හඳුනාගත් විශේෂ නිර්නායක -02 |
| 6.4 | කමිටුව හඳුනාගත් විශේෂ නිර්නායක -03 |
| 6.5 | කමිටුව හඳුනාගත් විශේෂ නිර්නායක -04 |
| 6.6 | කමිටුව හඳුනාගත් විශේෂ නිර්නායක -05 |
| | **ඉල්ලුම්කරු / පවුල විසින් ලබාගෙන ඇති මුළු ලකුණු සංඛ්‍යාව** |

ඉහත සඳහන් තොරතුරු මා විසින් ඉතා පැහැදිලිව තේරුම් ගැනීමෙන් අනතුරුව මෙම පරීක්ෂණයට පැමිණි නිලධාරින් හා කමිටු සාමාජිකයින් සමඟ එක්ව සම්පූර්ණ කරන ලද බව තහවුරු කරමි.

......................................

**ඉල්ලුම්කරුගේ අත්සන**

අප විසින් පුද්ගලිකව ඉල්ලුම්කරුගේ පදිංචි පරිශ්‍රය පරීක්ෂාකර තොරතුරු තහවුරු කළෙමු.

**කමිටු නිර්දේශය - නිර්දේශ කරමු / නිර්දේශ නොකරමු**

**කමිටු සාමාජික නම සහ අත්සන**

01. 02. 03.

04. 05. 06.

**ඇමුණුම් අංක 02**

................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

දිනය : .....................................

............................................................ මයා/ මිය/ මෙනවිය,

...........................................................

...........................................................

(සහනාධාරය ලැබිය යුතු සුදුසුකම් ලත් අයගේ නම සහ ලිපිනය)

ග්‍රාම නිලධාරි වසම : .............................................................

**<u>දිළිඳුකම ජයගැනීම සඳහා සමෘද්ධි දීමනාව ප්‍රදානය කිරිම.</u>**

ඔබ විසින් .............................................. දින ඉදිරිපත් කරන ලද සමෘද්ධි සහනාධාර ඉල්ලුම්පත, තේරීම් කමිටුව මඟින් තෝරා ගෙන ඇති බව සතුටින් දන්වමි.

02. ඒ අනුව රු. ............................................ වටිනා සහනාධාර දීමනාවක් .................................... දින සිට නැවත දන්වන තුරු ඔබ පවුල වෙත ලබාදෙනු ඇත.

03. එම සහනාධාර වටිනාකමින් සමාජ ආරක්ෂණ අරමුදල සඳහා රු. .................ක හා නිවාස ලොතරැයි අරමුදල සඳහා රු. .......................ක මුදලක් දායක කළ යුතු අතර අනිවාර්යය ඉතිරිකිරීම සඳහා රු. ......................... හා මුදලින් රු....................... ඔබගේ සමෘද්ධි බැංකුවේ සාමාජික ගිණුමට බැර වේ.

04. මෙම සහනාධාරය භුක්ති විඳීමේ දී ඔබට පහත සඳහන් අමතර ප්‍රතිලාභද හිමි වේ.
ඒ සඳහා ඔබ විසින් සමාජ ආරක්ෂණ හිමිකම් ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර ඔබ අයත් වසමේ සමෘද්ධි සවංර්ධන නිලධාරි මඟින් සමෘද්ධි කලාප කාර්යාලය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. දරු උපතක දී රු.10,000/- ක දීමනාවක් හිමි වේ. (උපරිම අවස්ථා 03 ක දී) මීට අමතරව නිවුන් දරු උපතකදී, දරුවන් දෙදෙනෙකු සඳහා මසකට රු. 5,000/- බැගින් හා තුන්දරු හා ඊට වැඩි උපතකදී මසකට රු 10,000/- වසරක කාලයක් සඳහා අමතර මුදල් ආධාර හිමිවේ.

ii. පවුලේ සාමාජිකයකුගේ විවාහක දී රු.10,000/- ක දීමනාවක් හිමිවේ. (උපරිම අවස්ථා 02ක දී)

iii. පවුලේ සාමාජිකයකුගේ රෝහල් ගත වීමකදී එම පවුලට වසරකට දින 30 ක උපරිමයකට යටත්ව අවමය දින 05 ක් සඳහා දිනකට රු. 350/- ක උපරිම රු.10,500/- දිමනාවක් හිමිවේ.

iv. පවුලේ සාමාජිකයකුගේ මරණයක දි රු.20,000/- ක දීමනාවක් හිමිවේ.

v. ඔබගේ පවුලේ දරුවකු අ.පො.ස. (සා.පෙළ) සමත්ව අ.පො.ස. (උ.පෙළ) හැදෑරීමේදී මසකට රු. 1,500/= බැගින් වසර 2 සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ හිමි වේ.

( ඉහත i , ii , iii, iv, v ට අදාළව කරුණු චක්‍ර ලේඛන උපදෙස් මත සංශෝධනය විය හැක.)

vi. ඔබ නිවාස ලොතරැයි ජයග්‍රාහකයකු වුවහොත් ඔබට රු.200,000/- ක මුදල් ත්‍යාගයක් නිවාස තනාගැනිම හෝ වැඩිදියුණු කරගැනීම සඳහා හිමිවේ.

05. සහනාධාර ලබන දිනයේ සිටම ශක්තිමත් ආර්ථික පදනමක් ඔබ පවුල තුළ ගොඩනගා ගැනීමට කටයුතු කල යුතු වේ.

06. ඔබගේ පවුල් ඒකකය තුළ සිටින සියලුම සාමාජිකයන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වැළකිය යුතුය.

07. ඔබ සමෘද්ධි වැඩසටහන තුළ ක්‍රියාකාරි සාමාජිකයෙකු විය යුතුය. (මේ අනුව කණ්ඩායම් රැස්වීම්, මාසික ප්‍රජා මූල රැස්වීම්, ඉතිරිකිරීම් ක්‍රියාවලියන්ට සක්‍රියව දායක විය යුතුය.)

08. ඔබ පවුලේ ආර්ථිකය ශක්තිමත් කරගැනීම සඳහා ඔබ සතුව පැහැදිලි පවුල් සංවර්ධන සැලැස්මක් තිබිය යුතුය.

09. ඔබ මෙම සහනාධාර ප්‍රදානය ලබාගැනීම පිණිස ඔබගේ ස්ථිර පදිංචි ලිපිනයට අයත් සමෘද්ධි බැංකුවේ සාමාජික ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භ කර බැංකු ක්‍රියාවලියට සම්බන්ධ විය යුතුය.

10. ඔබගේ පවුලේ සාමාජික සංඛ්‍යාව සංශෝධනය වුවහොත් සහනාධාර වටිනාකම ද සංශෝධනය වනු ඇත.

11. ඔබගේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් ඒ බව මා වෙත දැන්විය යුතුය.

12. ඔබ විසින් සපයා ඇති තොරතුරු තේරීම් නිර්ණායකයන්ට පටහැනි හෝ සාවද්‍ය බවට අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක මෙම සහනාධාර ප්‍රදානය අත්හිටුවීමට හැකිබව සැලකිය යුතුය.

| | |
|---|---|
| ......................... | ................................................ |
| දිනය | ප්‍රාදේශිය ලේකම් |

ඉහත කරුණු පිළිබඳව දැනුවත් වූ බවටත්, එම උපදෙස් අනුව කටයුතු කරන බවටත් එකඟ වෙමි.

.

| | |
|---|---|
| ................................................ | ................................ |
| දිනය | ප්‍රතිලාභියාගේ අත්සන |
| | ප්‍රතිලාභියාගේ නම :- |